## *බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව*

ස්ථානය : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2012-03-29

වේලාව : පෙ.ව.09.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:-**

| | |
|---|---|
| 01. ගරු සභාපති, | ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා |
| 02. ගරු උපසභාපති | ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා |
| 03. ගරු නාගරික මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 04. ගරු නාගරික මන්ත්‍රී | ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා |
| 05. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම්. රූමි මැතිතුමා |
| 06. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 07.ගරු නාගරික මන්ත්‍රී | ඒ.අසංක නිල්මිණී විජේසිංහ මැතිතුමා |
| 08. ගරු නාගරික මන්ත්‍රී | චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා |
| 09. ගරු නාගරික මන්ත්‍රී | එම්.ජේ.මලීක්ෂා මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය:-**

01. එස්.එච්.අමිතා කාරුණාරත්න මිය ප්‍රධාන කළමණාකරන සහකාර

(01) **ආගම සිහිකිරිම:**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන :**

ගරු සභාපතිතුමා කථාකරමින්, අද දින පවත්වනු ලබන්නේ 2012 වර්ෂයේ මාර්තු මාසයට අදාළ මහා සභා රැස්වීම බවත්, ඒ සඳහා සහභාගීවීමට පැමිණ සිටින ගරු උපසභාපතිතුමා, ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා, ප්‍රධාන කළමණාකරන සහකාර නිලධාරී මහත්මිය සහ පුවත්පත් කලාවේදී මහතුන් ඉතා ගෞරවයෙන් යුතුව පිළිගන්නා බැව් පැවසීය.

ඉන් අනතුරුව අදහස් දැක් වු ගරු සභාපතිතුමා මෙම නගර සභාව මගින් 2012 වර්ෂය සඳහා සකස් කල අයවැය මගින් ගරු මන්ත්‍රීතුමන්ලා වෙත සංවර්ධන කටයුතු සඳහා මුදල් වෙන්කල අතර, මෙම සභාවේ ගරු උපසභාපතිතුමාට වෙන් කල මුදලින් නගර සභා බලප්‍රදේශයේ වැසිකිළි නොමැති අඩුආදායම්ලාභීන් වෙත වැසිකිළි ඉදිකරගැනීම සඳහා එක් ආධාරලාභියෙකුට රු.5000/- බැගින් මුල්‍යාධාර 25 ක් අද දින ලබාදුන් බැව් පැවසීය.

තව දුරටත් කථා කල ගරු සභාපතිතුමා ,අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තන ජාතික ප්‍රතිපත්තියට සමගාමීව එක් ගමකට එක් වැඩක් යන තේමාව මුල්කරගෙන දිවයිනා පුරා ගම් සංවර්ධනය කිරීමේ වැඩ සටහන පසුගිය දා ආරම්භ වු

කල බවත්, ඒ අනුව මෙම නගර සභාවේ ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා 06 දෙනා ද ග්‍රාම සේවා වසම් 06 ක වැඩ ආරම්භ කිරීම සඳහා මුල්ගල් තැබීම සිදුකල බැව් පවසමින් සභාවේ ඉදිරි වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

(03) **2012.02.23 වන දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කිරීම**

පසුගිය මහා සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා විසින් යෝජනා කල අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඒ.අසංක නිල්මිණි විජේසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව පසුගිය මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත විය.

(04) **පසුගිය වාර්තාව සමාලෝචනය කිරීම**

වාර්තාව සමාලෝචනය කිරීමක් සිදුනොවීය.

05. **පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම** :

06. **සභාවට ලැබී ඇති ලිපි/පෙත්සම්/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම:**

06:01 **තැන්පතුව වැඩිකර ගැනීම :**

උක්ත කරුණට අදාළව ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතියේ සාමාන්‍යාධිකාරී විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

ඉන්ධන මිල සීඝ්‍රයෙන් ඉහල ගොස් ඇති බැවින්, මෙම නගර සභාව විසින් තැන්පත් මුදල ප්‍රමාණවත් නොවන නිසා රු.500000/- ක් දක්වා තැන්පතුව වැඩිකිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇති බැවින්, 2012-04-01 දිනට පෙර එම මුදල තැන්පත් කිරීමට කටයුතු කරන ලෙස එමගින් දන්වා තිබිණ.

මෙම නගර සභාව විසින් ඉහත සඳහන් ආයතනයේ දැනට තැන්පත් කර ඇති මුදලට අමතරව තවත් රු.ලක්ෂයක මුදලක් තැන්පත් කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

06:02 **බළන්ගොඩ නගර සභා මහජන පුස්තකාලය සඳහා සකස් කල අතුරු ව්‍යවස්ථාව :**

බළන්ගොඩ නගර සභා මහජන පුස්තකාලය විසින් සකස් කර ඇති අතුරු ව්‍යවස්ථාවේ කෙටුම්පතක් සභාගත කරන ලදී.

06:03 **දැන්වීම් ඇලවීම තහනම් කිරීම :**

ඉහත සඳහන් කරුණට අදාළව ඉදිරිපත් කර ඇති 2012-03-28 දිනැති ලිපිය සභාගත කරන ලදී.

1961-10-26 දින ප්‍රකාශිත 1947-09-24 දින ගැසට් අංකඃ 9773 දරණ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත 1961 දැන්වීම් ඇලවීම සඳහා ප්‍රකාශිත ගැසට් පත්‍රයේ 05,06,07 වගන්තීන් අනුව බළන්ගොඩ නගරය තුල පිහිටි සියළුම විදුලි කණු , දුරකථන කණු ප්‍රධාන මාර්ගයට මුහුණලා ඇති තාප්ප,ගොඩනැගිලි බිත්ති, බස්නැවතුම්පොල, පොළ භූමිය යන ස්ථාන වල දැන්වීම් ඇලවීම තහනම් කිරීම සුදුසු බැව් එමගින් යෝජනා කර තිබුණි.

ගැසට් පත්‍රය ප්‍රකාරව අදාල යෝජනාව ක්‍රියාත්මක කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

### 06:04 **Night Soil Treatment පද්ධතියේ හදිසි නඩත්තු කටයුතු :**

උක්ත කරුණට අදාළව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

Night Soil Treatment පද්ධතියේ ජලය පිරිසිදු කිරීමේ පද්ධතියේ ක්‍රියාවලිය ඇණහිටීම නිසා ජලයේ BOD හා COD අගයන් වැඩිවීමට පටන්ගන්නා ලදී. ඒ අනුව තවදුරටත් එම පද්ධතියට ගලි අපද්‍රව්‍ය දැමීමට නොහැකි වී ඇති අතර, වහාම ඉතා කඩිනමින් සම්පුර්ණ පද්ධතිය සම්පුර්ණයෙන්ම ශුද්ධ පවිත්‍ර කර අලුතින් ජලය පුරවා සකස් කල යුතු බවත්, එසේ නොමැති වුවහොත්, එහි ක්‍රියාකාරී බැක්ටීරියා විනාශ වී පද්ධතිය අක්‍රියවීම සිදුවිය හැකි බැවින්, ඒ සදහා පහත සඳහන් වියදම දැරීමට සිදුවන බැව් සදහන් කර තිබුණි.

| | |
|---|---|
| ❖ දැනට තිබෙන ජලය ඉවත්කිරීම සඳහා අමතර වලවල් | |
| ❖ 03 ක් කැපීමට බැක්හෝ ලෝඩර් පැය 100 | 250000.00 |
| ❖ දිනකට රු.1000/- ක් බැගින් කම්කරු දින 30 | 30000.00 |
| ❖ අඩුපාඩු කොහු හා අවශ්‍ය ද්‍රව්‍ය | 20000.00 |
| | 300000.00 |

ඒ අනුව කම්කරුවන් යොදා මෙම කාර්යය කරවා ගැනීමට අනුමැතිය ඉල්ලා තිබිණ.

අදාල මුදල වැයකර අළුත්වැඩියාවන් සිදුකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

### 06:05 **කාර්පාක් අංකඃ 06 දරණ කඩ කාමරය සම්බන්ධවයි**

උක්ත කරුණට අදාළව පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

ඉහත කාරණයට අදාළව මෙම නගර සභාව වෙත යොමුකර ඇති අංකඃ සීඑල්ජී 62 හා 2012.01.02 දිනැති ලිපිය කෙරෙහි අවධානය යොමු කරන අතර, ප.පා.කො.චක්‍රලේක 2009/01 හි අංකඃ 1:7 වගන්තිය අනුව කඩ කාමරය බදු කුලී ගිවිසුමෙහි කාලය බදුකරුගේ ජීවිත කාලයට බලාත්මක වන බැවින්, ඒ අනුව ඩබ්.එල්.ආනන්ද යන අයට 2012 වර්ෂයේ සිට කාර්පාක් අංකඃ 06 කඩ කාමරය ලබාදීමට අනුමැතිය ලබාදිය නොහැකි බැවින් එමගින් අවධාරණය කර තිබුණි.

පළාත් සභාවේ නිලධාරීන් සමඟ සාකච්ඡා කර සභාවේ කොන්දේසි මත දැනට අදාල අයට ලබා දී ඇති බැව් ගරු සභාපතිතුමා සභාව වෙත දැනුම් දෙන ලදී.

### 06:06 **ආදායම් අංශයේ ක්ෂේත්‍ර රාජකාරී කටයුතු සඳහා යතුරු පැදියක් ලබාගැනීම** :

බළන්ගොඩ නගර සභා බලප්‍රදේශය පුළුල්වීමත් සමඟ බස්රථ හා පා ගමනින් ගොස් සියලුම දේපල පරීක්ෂා කර වරිපනම් හා බලපත්‍ර ගාස්තු අයකිරීමට අපහසු තත්ත්වයක් උදා වී

ඇති බැවින්, ආදායම් අංශයේ සියළු රාජකාරී සඳහා යතුරු පැදියක් ලබාදෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මුදල් තත්ත්වය අයහපත්වීම හා වාහන සඳහා වැයවන වියදම අධික බැවින්, අළුතින් යතුරු පැදියක් මිළදී ගැනීමට අනුමැතිය ලබානොදෙන ලදී.

06:07 **කොම්පෝස්ට් පොහොර ලබාගැනීම :**

ර/ බළන්ගොඩ ජෙයිලානී ජාතික පාසල් භූමියේ මල් පැල හා අනෙකුත් පැල වර්ග සිටුවීමට අදහස් කරන බැවින් , ඒ සඳහා කොම්පෝස්ට් පොහොර කිලෝ 50 ක් ලබාදෙන ලෙස ඉල්ලා එම විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් එවා ඇති 2012-03-21 දිනැති ලිපිය සභාගත කරන ලදී.

කොම්පෝස්ට් පොහොර කිලෝ 50 ක් නොමිලයේ ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

06:08 NVQ - **2 වන පාඨමාලාව ආරම්භ කිරීම :**

ඉහත සඳහන් කාරණයට අදාළව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

ඝන අපද්‍රව්‍ය කළමණාකරණයට අදාළ NVQ - 2 වන පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවීමටත් පාඨමාලා ගාස්තු ලෙස රු.10000/- ක් අය කිරීමටත් පාඨමාලාව පිළිබඳව සිංහල හා දෙමළ පුවත්පත් දැන්වීම් 02 ක් පළකිරීමට අනුමැතිය ඉල්ලා ඇති අතර, මෙම පාඨමාලාව 2012-06-01 දින සිට මාස 03 ක් සති අන්ත පාඨමාලාවක් ලෙස පැවැත්වීමටත් ඒ සඳහා ද අනුමැතිය ලබාදෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

06:09 **කඩ කාමරයක් පවත්වාගෙන යාමට කැමැත්ත ප්‍රකාශ කිරීම :**

බළන්ගොඩ බස්නැවතුම්පල පිහිටි අංකඃ ඒ 07 දරණ කඩ කාමරයේ නීත්‍යානුකූල බදුකරු වන ෆවුසුල් අමීර් යන අය විදේශගතවීමට කටයුතු කරන බැවින්, මෙම කඩ කාමරය නගර සභාවේ සියළුම කොන්දේසි වලට යටත්ව ගිවිසුම් ප්‍රකාරව පවත්වාගෙන යාමට කැමති බැවින්, ඔහු සතු සියළු අයිතිවාසිකම් තමන් වෙත පවරා දෙන ලෙස ඉල්ලා, බළන්ගොඩ, දෙහිගස්තලාව, අංකඃ 49 ලංකාබරණ පාර, යන ලිපිනයේ පදිංචි එස්.ඒ.එම්.රිෂාඩ් මහතා විසින් ඉදිරිපත් කර ඇති 2012.03.14 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ටෙන්ඩර් කොන්දේසි වලට ගැලපේ නම්, පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට යටත්ව ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

06:10 **විදේශ සංචාරයක් සදහා නිවාඩු අනුමත කරගැනීම ඃ**

ඉහත සඳහන් කරුණට අදාළව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මෙම නගර සභාවේ ගරු උපසභාපති, ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා 2012-05-26 වන දින සිට සති තුනක කාලයක් එක්සත් රාජ්‍යධානියේ පෞද්ගලික සංචාරක

යෙදීමට අපේක්ෂා කරන බැවින් , එම කාල සීමාව සඳහා නිවාඩු අනුමත කරදෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

අදාල කාල සීමාවට නිවාඩු අනුමත කල සභාව , මේ සඳහා පළාත් පාලන කොමසාරිස් වෙතින් අනුමැතිය ලබාගැනීමට තීරණය කරන ලදී.

07. මුදල් ගෙවීම් අනුමත කිරීම ( රු.10000/- ය වැඩි ගෙවීම් )
08. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම
09. ටෙන්ඩර් මිළ ගණන් සලකා බැලීම
10. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ : නැත
11. යෝජනා

11:01 ගරු උපසභාපති,ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා :

01. බළන්ගොඩ නගර සභා පොදු ක්‍රීඩාපිටිය සම්බන්ධව දැනට සංවර්ධනය කිරීමට බලපාන ගැටළුව කුමක් ද යන්න
ක්‍රීඩාපිටිය සංවර්ධනය නොකිරීමට හේතු වී කරුණු පැහැදිලි කරමින් ක්‍රීඩාපිටිය සංවර්ධනය කරගැනීමට අවශ්‍ය කටයුතු කරදෙන ලෙස අතිගරු ජනාධිපතිතුමන් වෙත ලිපියක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලීමක් කරන ලදී.

02. නගර සභා පොදු ක්‍රීඩාපිටියට පැරල්බා එකක් සවිකිරීම සහ පුටු 10 ක් මේසයක් ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී.

03. ක්‍රීඩාපිටියට තිබූ බැරියල් එක නැවත සවිකිරීම සුදුසු යැයි යෝජනා කරන ලදී.
ඉහත සඳහන් යෝජනා ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

11:02 ගරු නාගරික මන්ත්‍රී, ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා :

01. නව මහජනපොලේ ව්‍යාපාරිකයින්ට හා පාරිභෝගිකයින්ගේ පිපාසය නිවාගැනීම සඳහා පානීය ජලය ලබාගැනීමට පොළට පිවිසෙන ස්ථාන සකස් කර ඇති බුදු මැදුර අසල මෙම සභාව මගින් පැන්තාලියක් ඉදිකිරීමට යෝජනා කරන ලදී.

02. කාර්පාක් ඉදිරිපිටින් බස්නැවතුම්පළට යන මාර්ගයෙන් ඉරිදා පොළ හා සතිපොළ දක්වා පමණක් වාහන ධාවනය කිරීම සඳහා අවසර ලබාදීම සුදුසු බවත්, පොළට පිවිසෙන ස්ථානයේ අනතුරු සිදුවන බැවින් දැන්වීම් පුවරු ගසා ජනතාව දැනුවත් කරන ලෙසත් යෝජනා කරන ලදී. පොළ භූමියේ ත්‍රීරෝද රථ නවතා තබා ඇති නිසා පාරිභෝගික ජනතාව අපහසුතාවකට ලක්ව ඇති බැවින් ඉදිරි සිංහල අලුත් අවුරුදු උත්සවයට පෙර මේවා ක්‍රමවත් කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලීමක් කරන ලදී.

03. පොළ භූමියේ ඇති වැසිකිළියට ජලය ගබඩා කිරීම සඳහා ටැංකියක් ලබාදෙන ලෙස යෝජනා කරන ලදී.

04. බස්නැවතුම්පලට බස් රථ ඇතුළු කිරීම හා පිටකිරීම ඇතුළුව නගරයේ වාහන ධාවනය මීට වඩා ක්‍රමවත් කිරීම සුදුසු යැයි යෝජනා කරන ලදී. (මේ සම්බන්ධව පොලීසිය හා අදාල ආයතන සම්බන්ධව කරගෙන සාකච්ඡාවක් පැවැත්වීමට තීරණය කරන ලදී.)

ඉහත සඳහන් යෝජනා ගරු නාගරික මන්ත්‍රී ඒ.අසංක නිල්මිණි විජේසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

11:03 ගරු නාගරික මන්ත්‍රී, ඒ.අසංක නිල්මිණි විජේසිංහ මැතිතුමා :

01. බාන්ස්රවත්ත මාවතේ සහ නගරාසන්න අනෙකුත් ප්‍රදේශවල මාර්ග දෙපස ඇති අඩි තුනක් පමණ ගැඹුර අඩි දෙකක් පමණ පළල කාණුවල ආවරණයක් නොමැති නිසා අනතුරුදායක බැවින් කාණුමත ආවරණයක් දැමීම සඳහා පියවර ගැනීම.

02. වැවේවත්ත උද්‍යානයේ ඇති කාණු පද්ධතිය පස්ගොඩවීම නිසා සම්පුර්ණයෙන්ම වැසී ඇත. එහි ජලය ගලානොබැසීම හේතුවෙන් මදුරුවන් බෝවීම නිසා ඩෙංගු වැනි මාරාන්තික රෝගයන්ට උද්‍යානවාසීන් ලකම්ම සිදුවන බැවින් එම කාණු පද්ධතිය සකස් කිරීම( වතු අධිකාරී මහතා කැඳවා මේ සම්බන්ධව දැනුවත් කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.)

ඉහත යෝජනා ගරු උපසභාපතිතුමා විසින් ස්ථිර කිරන ලදී.

11:04 ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා :

01. කල්තොට පාර ලොන්ඩරිය අසල පොදු නාන ළිඳ පිළිසකර කිරීම.

02. කුසුම්සිරි මෝටර්ස් අසල තිබු පොදු ළිඳ පිළිබඳව සොයා බැලීම

( මෙම ළිඳ ප්‍රාදේශීය ලේකම් යටතේ පවතින නිසා ඒ සම්බන්ධව සභාවට කටයුතු කිරීමට නොහැකි බැව් ගරු සභාපතිතුමන් විසින් දැන්වීය.

03. පහළ ඇල්ලෙපොල පල්ලෙකන්දට හැරෙන මංසන්ධිය අසල වෙළගේ ගවරන්හේන අසල මාර්ගයට හැරෙන මංසන්ධිය අසල, ඇල්ලෙපොල චන්ද්‍රදාස මහතාගේ නිවස අසල, වෙළගේ පන්සල අසල, මාලිගාතැන්න, කුමාරගම,සරස්වතීපාර , උඩ ඇල්ලෙපොල යන ස්ථානයන් හි නගරය දෙසට ඇති බස්නැවතුම්පොලවල් සඳහා මගී ආවරණ ඉදිකිරීම.
මේ සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබාගැනීමට තීරණය කරන ලදී.

04. පල්ලෙකුඹුර මාර්ගයේ කැඩී ඇති ස්ථාන පිළිසකර කිරීම.

05. නාලන්දාව ඉදිරිපිට විවෘත කිරීමට යන බියර්හල සඳහා විරෝධය පළකිරීම.

මේ සම්බන්ධව මෙම නගර සභාවේ විරෝධය ප්‍රකාශ කර ඇති අතර, සුරාබදු ආඥා පනත අනුව මේ සඳහා අවසර ලබාදුනහොත් ඒ සම්බන්ධව කටයුතු කිරීමට සභාවට හැකියාවක් නොමැති බැව් ගරු සභාපතිතුමන් විසින් දැන්වීය.

ඉහත සදහන් යෝජනා ගරු නාගරික මන්ත්‍රී ඒ.අසංක නිල්මිණි විජේසිංහ මැතිතුමා විසින් ස්ථිර කරනලදී.

12. ආදායම් - වියදම් වාර්තා හා අනෙකුත් වාර්තා ඉදිරිපත් කිරීම.
13. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම
14. වෙනත් කරුණු

14:01 ගරු නාගරික මන්ත්‍රී, එම්.ටී.එම්.රුමි මැතිතුමා :

ගරු මන්ත්‍රීතුමා කථාකරමින්, අතිගරු ජනාධිපතිතුමා මෙම මස 31 වන දින ර/බළන්ගොඩ ජාතික පාසලේ දෙමහල් ගොඩනැගිල්ල විවෘත කිරීම සඳහා පැමිණෙන බවත්, එතුමාගේ එම ඓතිහාසික සංචාරයට බළන්ගොඩ නගර සභාවේ සුභ පැතුම් පළකරන බැව් පැවසීය.

එතුමාගේ පැමිණීම නිමිත්තෙන් ර/බළන්ගොඩ ජෙයිලානි ජාතික පාසලේ පිවිසුම් මාර්ගය කාපට් කර සංවර්ධනය කිරීම සම්බන්ධව සතුට පළකරන අතර, එම කාර්යය කරගැනීම සදහා මුල්‍ය ප්‍රතිපාදන ලබාදීම සම්බන්ධව විෂය භාර ගරු අමාත්‍යතුමාටත් , මේ සදහා දායක වෙමින් අවශ්‍ය සහයෝගය දැක් වූ සියළු දෙනාටත් විද්‍යාලීය ස්තුතිය පළකරන බැව් පැවසීය.

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තන ජාතික ප්‍රතිප්තියට අනුව එක් ගමකට එක් වැඩක් යන තේමා පාඨය පෙරදැරි කරගෙන පසුගිය ..... යෙදුණු සුභ මොහොතින් දිවයින පුරා වැඩ ආරම්භ කල බැව් පැවසීය. ඒ අනුව මෙම නගර සභාවේ ගරු මන්ත්‍රීවරුන් ද තම තමන් නියෝජනය කරනු ලබන බලප්‍රදේශයන් හි අදාල සංවර්ධන කාර්යය ආරම්භ කිරීම සදහා මුල්ගල තැබූ බැව් පැවසීය. තමන් නියෝජනය කරනු ලබන බළන්ගොඩ පිරිවෙන පාර කාණු පද්ධතිය සකස් කිරීම සඳහා ද මුල්ගල තැබූ බවද සදහන්කල ගරු මන්ත්‍රීතුමා, දෙහිගස්තලාව පල්ලිය අසල සිට මහවත්ත පාර කාණු පද්ධතිය අවසන් වන ස්ථානයේ ජලය බැහැරවීම අවහිර කරමින් එක්තරා පුද්ගලයෙකු විසින් පැතිබැම්මක් ඉදිකර ඇති බවත්, එම නිසා කාණු පද්ධතිය සංවර්ධනය කිරීමට බාධාවක් පැමිණ ඇති බැව් පැවසීය. එම නිසා වහාම එම පැති බැම්ම කඩා ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස අදාල අය වෙත උපදෙස් ලබාදෙන ලෙසත්, ඔහු එසේ නොකරන්නේ නම් නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ඉල්ලීමක් කරන ලදී.

තවදුරටත් කථා කල ගරු මන්ත්‍රීතුමා, එක් ගමකට එක් වැඩක් යන සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉටුකරනු ලබන කර්මාන්තයන් හි වැඩ කටයුතු ඉටුකරගැනීම සදහා සභාවෙන් ලක්ෂ 02 ක අත්තිකාරම් මුදලක් ලබාදෙන ලෙස ඉල්ලීමක් කරන ලදී.

15. අවසානය.